ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව - II | කාලය පැය 02 යි |
|---|---|---|

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් දෙකකින් සමන්විත ය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් <u>තුනටම</u> පිළිතුරු සැපයිය යුතුය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව <u>**පහකි**</u>.

---

<u>I කොටස</u>

01. (අ) ඔබ වෙත සපයා ඇති 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අංක I සිට IV දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i. අංක (01) න් දක්වා ඇත්තේ කුමක් ද?
(ගල / රක්ෂිත වන මායිම / ගල්වල) (ල. 01)

ii. අංක (02) න් දක්වා ඇත්තේ කුමක් ද?
(ගෙවතු වගාව / වී වගාව / වෙනත් වැවිලි) (ල. 01)

iii. අංක (03) න් දක්වා ඇත්තේ කුමක් ද?
(පොලීසිය / රෝහල / පාසල) (ල. 01)

iv. අංක (04) න් දක්වා ඇති පරිපාලන මායිම කුමක් ද?

(ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම / ග්‍රාම නිලධාරි කොට්ඨාස මායිම / පළාත් මායිම) (ල. 01)

v. සිතියමේ ගිනිකොණ කාර්තුවේ දැකිය හැකි පූජනීය ස්ථානයක් නම් කරන්න. (ල. 01)

vi. සිතියම් ප්‍රදේශය හොඳින් අධ්‍යානය කොට පහත එක් එක් ප්‍රකාශ කියවා බලා නිවැරදි නම් "නි" යන්න ද වැරදි නම් "වැ" යන්න ද පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයෙහි ලියා දක්වන්න.

a. වාරි ජලය උපයෝගී කරගෙන කෘෂිකාර්මික කටයුතු කෙරෙන ප්‍රදේශයකි. (ල. 01)
b. සිතියමේ දකුණු මායිමට ආසන්නයේ දැකිය හැක්කේ ඒකීය දුම්රිය මාර්ගයකි. (ල. 01)
c. මෙම සිතියම් කොටස තෙත් කලාපයට අයත් ප්‍රදේශයකි. (ල. 01)

vii.



යාබඳව ඇඳ ඇති හරස්කඩය හොඳින් අධ්‍යානය කොට එය නිර්මාණය කර ඇත්තේ සිතියමෙහි දක්වා ඇති A, B හා C, D යන රේඛා දෙකෙන් කුමන රේඛාවකට අදාලව දැයි දක්වන්න. (ල. 01)

viii. P සිට Q දක්වා ප්‍රධාන මාර්ගයේ දිග කිලෝ මීටර්වලින් දක්වන්න. (ල. 01)

www.edudept.up.gov.lk

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. A, B, C යන අක්ෂර අතරින් "මහා වාලුකා කාන්තාරය" දැක්වෙන අක්ෂරය කුමක් ද?

ii. D, K, L යන අක්ෂර අතරින් "මලක්කා සමුද්‍ර සංධිය" දැක්වෙන අක්ෂරය කුමක් ද?

iii. E, J, M යන අක්ෂර අතරින් ඇට්ලස් කඳුවැටිය දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද?

iv. N, O,P යන අක්ෂර අතරින් "තස්මේනියාව දූපත" දැක්වෙන අක්ෂරය නම් කරන්න.

v. H, B, E යන අක්ෂර අතරින් "පැම්පාස් තෘණ භූමිය" අයත් අක්ෂරය නම් කරන්න.

(ලකුණු 5 )

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. A, E, D යන අක්ෂර අතරින් "මහවැලි සී" කලාපයට අයත් ගිරාඳුරුකෝට්ටේ නිරූපණය වන අක්ෂරය කුමක් ද?

ii. G, H, F යන අක්ෂර අතරින් හික්කඩුව කොරල්පර නිරූපණය වන අක්ෂරය කුමක් ද?

iii. A, B, I යන අක්ෂර අතරින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල පිහිටි දිස්ත්‍රික්කයට හිමි අක්ෂරය නම් කරන්න.

iv. A, J, E යන අක්ෂර අතරින් සවිරාම ජලවහන රටාවක් දැකිය හැකි ප්‍රදේශය පිහිටි අක්ෂරය නම් කරන්න.

v. H, G, F යන අක්ෂර අතරින් දර්ශනීය වෙරළ තීරයක් වන "නිලාවැලි වෙරළ තීරයට" හිමි අක්ෂරය නම් කරන්න.




www.edudept.np.gov.lk

(ලකුණු 05 )

**II කොටස**

02. i. ලෝක මට්ටමින් පුළුල් දේශගුණ වර්ගීකරණ ඉදිරිපත් කළ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)
   ii. යම් ප්‍රදේශයක දේශගුණ වර්ගයක් තීරණය වීම කෙරෙහි බලපාන සාධක තුනක් නම් කරන්න. (ල. 3)
   iii. (a) ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න.
   (b) කර්කටක හා මකර නිවර්තන රේඛා දෙක අතර කලාපයේ දක්නට ඇති දේශගුණික තත්ත්වය පිළිබඳ කරුණු දෙකක් විස්තර කරන්න. (ල. 5)

- අංක 3 සහ 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා සපයා ඇති ලෝක සිතියම ආධාර කර ගන්න.




03. i. (a) A අක්ෂරයෙන් දැක්වෙන "චීනයේ ශෝකය" නමින් හැඳින්වෙන නැගෙනහිර ආසියාවේ පිහිටි ගංගාව ද
   (b) B අක්ෂරයෙන් දැක්වෙන නිරතුරුව ගංවතුර තර්ජනයට ලක්වන දකුණු ආසියාතික රට ද පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

   ii. ජෛව ගෝලයේ පැවැත්ම රඳා පැවතිම සඳහා අන්තර් ක්‍රියාකාරිත්වය දක්වන පද්ධති තුන නම් කරන්න. (ල. 3)
   iii. ජෛව ගෝලයේ සමතුලිත බව බිඳ වැටීමට බලපා ඇති මානුෂ ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න. (ල. 5)

04. i. ඉහත ලෝක සිතියමෙහි C හා D අක්ෂර වලින් ලෝකයේ තේ වගාව ව්‍යාප්තව ඇති ප්‍රධාන රටවල් දෙකක් දක්වා ඇත. ඒවා පිළිවෙලින් නම් කරන්න. (ල. 2)

   ii. (a) ලෝකයේ සෑම රටකම භාවිතා කරන පානයක් වූ "තේ" සොයාගන්නා ලද්දේ කුමන ජාතිකයන් විසින් ද?
   (b) "තේ" වගාවේ විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 3)




   iii. (a) යාබද ශ්‍රී ලංකා සිතියමෙහි A අක්ෂරයෙන් දක්වා ඇති "උඩරට තේ වගාව" ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කය ද, B අක්ෂරයෙන් දක්වා ඇති මැදරට තේ වගාව ව්‍යාප්තව ඇති දිස්ත්‍රික්කය ද පිළිවෙලින් නම් කරන්න.

   (b) තේ වගාව දියුණු කිරීමෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ල. 5)

05. i. ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනයේ සීඝ්‍ර දියුණුවක් දැකිය හැකි නැගෙනහිර ආසියාතික රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)

ii. මෝටර් රථ නිෂ්පාදන කර්මාන්තයෙහි දැකිය හැකි නූතන ප්‍රවණතා තුනක් සඳහන් කරන්න. (ල.3)

iii. (a) ශ්‍රී ලංකාවේ මයික්‍රෝ වාහන එකලස් කිරීමේ ප්‍රධාන කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශය නම් කරන්න
(b) මෝටර් රථ කර්මාන්තය ආශ්‍රිත ගැටළු දෙකක් සඳහන් කරන්න
(c) මෝටර් රථ කර්මාන්තය දියුණු කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

06. i. ලෝකයේ ස්වභාවික උපද්‍රව ඇති වීමට බලපාන
(a) භූ විද්‍යාත්මක උපද්‍රවයක් ද,
(b) දේශගුණික උපද්‍රවයක් ද සඳහන් කරන්න. (ල. 2)

ii. සුනාමි රළක් ඇතිවීමට බලපාන හේතු තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. (a) ශ්‍රී ලංකාවේ ජලගැලීම් බහුලව දැකිය හැකි ගංභාධාර තුනක් නම් කරන්න.
(b) ජලගැලීම් ආපදාව අවම කර ගැනීමේ ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ල. 5)

07. i. ජන සංඛ්‍යාවේ විශාලත්වය අනුව ආසියා මහද්වීපයේ වැඩි ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් දෙකක් නම් කරන්න. (ල. 2)

ii. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ අධික ජල සංකේන්ද්‍රණයක් පැවතීමට බලපා ඇති සාධක තුනක් විස්තර කරන්න. (ල. 3)

iii. අධික ජන සංඛ්‍යාවක් වාසය කරන නගරවල ජන පීඩනය අඩු කිරීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න. (ල. 5)

08. i. සංවර්ධනය මැනීමේ මිනුම් ක්‍රම අතරින්
(a) නූතන මිනුම් ක්‍රම එකක් හා
(b) පැරණි මිනුම් ක්‍රම එකක් සඳහන් කරන්න. (ල. 2)

ii. තිරසාර සංවර්ධනය මගින් අපේක්ෂා කරන කරුණු තුනක් සඳහන් කරන්න. (ල. 3)

iii. රටක පැවැත්ම සඳහා තිරසාර සංවර්ධන ක්‍රියාදාමයක අවශ්‍යතාව කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 5)

www.edudept.up.gov.lk